රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

| දුරකතන / தொலைபேசி / Telephone | ෆැක්ස් / தொலைநகல் / Fax | ඊ-මේල් / மின்னஞ்சல் / E-mail | වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site |
|---|---|---|---|
| **(94) 011- 2694560** | **(94) 011- 2692254** | **dgcs@pubad.gov.lk** | **www.pubad.gov.lk** |


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| COMS/DO/TRANS/Special Vacancies (Web Publish) | | 2024.07.02 |

සියලු අමාත්‍යාංශ ලේකම්වරු
සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියලු දිස්ත්‍රික් ලේකම්වරු/ප්‍රාදේශීය ලේකම්වරු

**<u>ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරීන් MISCO පද්ධතිය යාවත්කාලීන කිරීම සම්බන්ධවයි.</u>**

ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ මාගේ අංක COM/TRANS/V/වා.ස්.මා./2024 හා 2024.06.11 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ සියළු තොරතුරු MISCO පද්ධතියට ඇතුළත් කිරීම/යාවත්කාලීන කිරීම පිළිබඳව අදාල නිලධාරීන් දැනුවත් කරන ලෙසට මාගේ අංක COMS/DO/Trans/V/වා.ස්.මා.2023 හා 2023.06.06 දිනැති ලිපිය මඟින් උපදෙස් ලබා දෙන ලදී.

03. නමුත් 2024 වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් ඉදිරිපත් කිරීමේදී ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරීන් නිසියාකාරව MISCO පද්ධතිය වෙත තොරතුරු ඇතුළත් නොකිරීම හා යාවත්කාලීන නොකිරීම මත ස්ථාන මාරු මණ්ඩලය මෙන්ම අභියාචනා සමාලෝචන කමිටුව ද අපහසුතාවයට පත් වූ අතරම, අදාළ නිලධාරියා මෙන්ම වාර්ෂික ස්ථාන මාරු චක්‍රයට අදාල අනෙකුත් නිලධාරීන් ද අගතියට පත්වීම නිරීක්ෂණය විය.

04. එබැවින් ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන්ගේ තොරතුරු MISCO පද්ධතියට ඇතුළත් කිරීමේදී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

(i) MISCO පද්ධතියට තොරතුරු ඇතුළත් නොකරන ලද නිලධාරීන් හට තම ජාතික හැඳුනුම්පත් අංකය භාවිතයෙන් පරිශීලක ගිණුමක් ආරම්භ කර අදාල තොරතුරු ඇතුළත් කරන ලෙසත්,

(ii) දැනටමත් තොරතුරු MISCO පද්ධතිය වෙත ඇතුළත් කර ඇති නිලධාරීන්ගේ,

- වර්තමාන සේවා ස්ථානය නිවැරදිව යාවත්කාලීන කර ඇති බව,
  (මේ සඳහා පහත මාර්ගය අනුගමනය කරන්න)
  ***Personal – personal information – add new employee – employment details – Find institute – select relevant district – select relevant institute***

(a) නිලධාරියා අමාත්‍යාංශයක් / දෙපාර්තමේන්තුවක් යටතේ සේවය කරයි නම්,
උදා : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයේ සේවය කරයි නම්, අමාත්‍යාංශ කාණ්ඩය යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය ලෙසත්

(b) නිලධාරියා කිසියම් අමාත්‍යාංශයක්/ දෙපාර්තමේන්තුවක් යටතේ ප්‍රාදේශීය කාර්යාලයක සේවය කරයි නම්,
උදා : කම්කරු දෙපාර්තමේන්තුව යටතේ මාතර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සේවය කරයි නම්, දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ කම්කරු දෙපාර්තමේන්තුවද ඉන් අනතුරුව ඒ යටතේ උප කාර්යාල කාණ්ඩය යටතේ මාතර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ලෙසත්

(c) නිලධාරියා කිසියම් අමාත්‍යාංශයක් /දෙපාර්තමේන්තුවක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සේවය කරයි නම්,
(Ministry attachment/ Department attachment)
උදා : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හි සේවය කරයි නම්, අදාල Department attachment කාණ්ඩය යටතේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ලෙසත්

(d) නිලධාරියා ජාතික රෝහලක සේවය කරයි නම්,
උදා : කරාපිටිය ශික්ෂණ රෝහලේ සේවය කරයි නම් රෝහල් කාණ්ඩය යටතේ කරාපිටිය ශික්ෂණ රෝහල ලෙසත්

(e) නිලධාරියා ජාතික පාසලක සේවය කරයි නම්,
උදා : කොළඹ රාජකීය විද්‍යාලයේ සේවය කරයි නම්, පාසල් කාණ්ඩය යටතේ කොළඹ රාජකීය විද්‍යාලය ලෙසත්

(f) නිලධාරියා ස්වදේශ කටයුතු අංශය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක හෝ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක සේවය කරයි නම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල හෝ ප්‍රාදේශිය ලේකම් කාර්යාල කාණ්ඩය යටතේ අදාල කාර්යාලයද තෝරාගෙන පද්ධතියට ඇතුලත් කල යුතුය.

- පෙර සේවා විස්තරය නිවැරදිව යාවත්කාලීන කර ඇති බව,
- නිලධාරියා වර්තමාන සේවා ස්ථානයට වාර්තා කරන ලද දිනය නිවැරදිව යාවත්කාලීන කර ඇති බව,
- නිලධාරියාගේ පෞද්ගලික තොරතුරු යාවත්කාලීන කර ඇති බව,

05. එසේම ආයතනයෙන් පිටතට ස්ථාන මාරු වී ඇති නිලධාරීන් (වාර්ෂික ස්ථාන මාරු, වාර්ෂික නොවන ස්ථාන මාරු හා අභ්‍යන්තර ස්ථාන මාරු) සේවා ස්ථානය යාවත්කාලීන නොකිරීම මත පෙර සේවා ස්ථානය යටතේම සේවය කරන බව නිරීක්ෂණය වන බැවින් එවැනි නිලධාරීන්ගේ වර්තමාන සේවා ස්ථානය නිවැරදි ලෙස යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් විෂය භාර නිලධාරීන් දැනුවත් කිරීම. මේ සඳහා පහත ක්‍රම අනුගමනය කල හැකිය.

**(අ) වාර්ෂික ස්ථාන මාරුවීම්**

**1 ක්‍රමය**

ආයතනික ගිණුම මඟින් - ස්ථාන මාරුව ලබා දී ඇත්තේ MISCO මෘදුකාංගය ඔස්සේ බැවින් ප්‍රධාන මෙනුවෙහි ඇති Transfer – Entry - Releasement යන සබැඳිය ඔස්සේ ආයතනයෙන් පිටතට ස්ථාන මාරු කළ නිලධාරියා සේවා ස්ථානයෙන් නිදහස් කිරීම කළ බව යාවත්කාලීන කළ යුතුය.
එසේම ස්ථාන මාරු කළ නිලධාරියාගේ නව සේවා ස්ථානයෙන් Transfer – Entry -Duty Assume සබැඳිය ඔස්සේ නිලධාරියා නව සේවා ස්ථානයට වාර්තා කිරීම යාවත්කාලීන කළ යුතුය.

**2 ක්‍රමය**

නිලධාරියාගේ ගිණුම මඟින් - නිලධාරියා තම පෞද්ගලික MISCO ගිණුම ඔස්සේ පිවිස මෙනුවෙහි ඇති Personal - personal Information - Add New Employee - Employee Details හි Work Place හා Date of duty assumed at current institute හි දත්ත යාවත්කාලීන කළ යුතුය.

**(ආ) වාර්ෂික නොවන ස්ථාන මාරුවීම (සාමාන්‍ය ස්ථාන මාරුවීම)**

නිලධාරියාගේ ගිණුම මඟින් - නිලධාරියා තම පෞද්ගලික MISCO ගිණුම ඔස්සේ පිවිස මෙනුවෙහි ඇති Personal - personal Information - Add New Employee - Employee Details හි Work Place හා Date of duty assumed at current institute හි දත්ත යාවත්කාලීන කළ යුතුය.

**(ඇ) අභ්‍යන්තර ස්ථාන මාරුවීම්**

නිලධාරියාගේ ගිණුම මඟින් - නිලධාරියා තම පෞද්ගලික MISCO ගිණුම ඔස්සේ පිවිස මෙනුවෙහි ඇති Personal - personal Information - Add New Employee - Employee Details හි Work Place හා Date of duty assumed at current institute හි දත්ත යාවත්කාලීන කළ යුතුය.

**මෙහිදී අදාල විෂය භාර නිලධාරීන් විසින් MISCO පද්ධතිය තුළ තම ආයතනයේ සේවය කරන සංවර්ධන නිලධාරීන් පිළිබඳ යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතියක් තිබීම සම්බන්ධයෙන් වග කිව යුතු අතර, සති 2කට වරක්වත් පරීක්ෂා කොට MISCO පද්ධතිය යාවත්කාලීන වී ඇති බවට තහවුරු කරගත යුතුය.**

06. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාලය යටතේ Misco පද්ධතියෙහි යාවත්කාලීන නොවූ කාර්යාල පවතී නම් අදාල කාර්යාල සම්බන්ධයෙන් වූ තොරතුරු කඩිනමින් ddsc4.pubad@gmail.com යන විද්‍යුත් තැපැල වෙත යොමු කරන මෙන් විෂය භාර නිලධාරින් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

07. Misco පද්ධතියට මාර්ගගත ක්‍රමයෙන් තොරතුරු ඇතුලත් කිරීමට,

a. LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් http://10.250.1.112/misco වෙබ් ලිපිනය ඔස්සේද,
b. වෙනත් ජාලයක් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් http://43.224.125.68/misco වෙබ් ලිපිනය ඔස්සේද හැකියාව ඇත.

08. තවද , Misco පද්ධතිය වෙත තොරතුරු ඇතුලත් කිරීමේදී ඒ සඳහා අවශ්‍ය වැඩිදුර උපදෙස්

a. පරිශීලකයන් සඳහා - පද්ධතියෙහි අතුරුමුහුණතෙහි ***Help* ⟶*User*** මගින්ද,
b. ආයතන සඳහා ***Help* ⟶ *Institute*** මගින්ද ලබා ගැනීමේ හැකියාව ඇත.

09. මේ අනුව ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන්, ඊට අදාල විෂය භාර නිලධාරීන් දැනුවත් කිරීම මෙන්ම, ආයතන ප්‍රධානීන් ලෙස ආයතනය තුළ තොරතුරු ඇතුළත් කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකසා දෙන ලෙස කාරුණිකව දන්වා සිටින අතර, සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ගේ යාවත්කාලීන තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා ඔබ ලබා දෙන දායකත්වය හා සහයෝගය තවදුරටත් අපේක්ෂා කරමි.

**එස්.ආලෝකබණ්ඩාර**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්